**ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 26 - 2023**

**-----------------------------------------------------------------**

1. **විගණන මතය**

1.1 ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 26 ක 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 26 කට අදාලව නිකුත් කර තිබුණු විගණන වාර්තා 26 හි කාරක සභා 01 ක මතය ව්‍යාවනය කර තිබූ අතර, කාරක සභා 25 ක් සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. ඒ සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුලත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 07 ක මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොතිබුණි. | පිළිගනිමි. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 03 ක ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 2 හි 9 වන වගන්තිය ප්‍රකාරව රු.2,059,663 ක් වටිනාකමැති වසරක කල්පිරීමක් සහිත ස්ථාවර තැන්පත් 4 ක් ආයෝජන ක්‍රියාකාරකම් ලෙස දැක්වීම වෙනුවට මූල්‍ය ක්‍රියාකාරකම් ලෙස දක්වා තිබුණි. ගිණුම්කරණ ප්‍රමිත අංක 9 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කර මූල්‍ය ප්‍රකාශ කට්ටලයට ඇතුලත් කළ යුතු වුවත්, ප්‍රධාන මුදල් ප්‍රවාහ හඳුනාගෙන වර්ගීකරණය කිරීමකින් තොරව ගොවිජන බැංකු අංශයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණි. | පිළිගනිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ප්‍රකාරව මුදල් ප්‍රවාහය සකස් කර ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී භාවිතා කල සියළු ආදායම් උපචිත පදනම මත ගිණුම් තැබීම කල යුතු වුවත්, අක්කර බදු ආදායම මුදල් පදනමට ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. | සියළු ආදායම් වියදම් උපචිත පදනම මත ගිණුම් තැබීම කල යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි සදහන් අංක 26 සිට 86 දක්වා වූ වගන්ති ප්‍රකාරව කාරක සභා 26 හිම කාරක සභාව පිහිටුවා ඇති ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණු අතර කාරක සභා 3 ක් වත්කමක ක්ෂය කළ හැකි අගය ප්‍රයෝජනවත් ජීව කාලය පුරා බෙදා නොහැර හීනවන ශේෂ ක්‍රමයට ක්ෂය කර තිබූ අතර තවත් කාරක සභා 3 ක් ස්ථාවර වත්කම සම්බන්ධයෙන් කලයුතු හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි. තවද, වත්කමක ඵලදායී ජීව කාලය සෑම ගිණුම් වර්ෂයකදීම සමාලෝචනය කළයුතු වුවද ක්ෂය අවසන් වූ වත්කම් ජීව කාලය සමාලෝචනය නොකර ශුන්‍ය අගයකට ස්ථාවර වත්කම් ලේඛනය තුළ දක්වා තිබුණි. | පිළිගනිමි. ගොවිජන සේවා කාරක සභාව පිහිටුවා ඇති ඉඩම් හා ගොඩනැහිලි තක්සේරු කිරීම ගොවිජන සේවා සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදු කරනු ලබයි. නිවැරදි ක්ෂය අනුපාත ඉදිරි වර්ෂයේ දී යොදා ගැනීමට අදහස් කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | ගොවිජන බැංකුව ගොවිජන සේවා කාරක සභාවේ ඒකකයක් බැවින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වුවත් කාරක සභා 26 ම එපරිදි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | පිළිගනිමි. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් සපයා ඇති ආකෘතිය ප්‍රකාරව ගිණුම් වාර්තාව සකස් කර ඇත. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ගලහිටියාව ගොවිජන සේවා කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂය තුල දී සිදු කරන ලද තොග හා මුදල් අක්‍රමිකතාව සම්බන්ධව නිශ්චිත හා ප්‍රමාණවත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | අක්‍රමිකතා පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ යුතුය. |

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 03 ක රු.423,863 ක් වටිනා පරිගණක හා උපාංග, උපකරණ මිලට ගැනුම් දේපල පිරියත උපකරණ යටතේ සටහන් කිරීම වෙනුවට එය සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි. | පිළිගනිමි. 2024 වාර්ෂික ගිණුම් වාර්තාවෙන් නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | වර්ෂයේ ප්‍රාග්ධන වියදම් නිවැරදිව හදුනාගෙන ගිණුම්ගත කිරීමටත් ඒ අනුව ක්ෂය ප්‍රතිපාදන ඇති කිරීමටත් කටයුතු |

| | | | |
|---|---|---|---|
| | | | කළ යුතුය. |
| (ආ) | 1990 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයන්ට අදාලව ගොවිජන සේවා කාරක සභා 13 ක රු.864,251 ක් වූ විගණන ගාස්තු සමාලෝචිත වර්ෂය අවසාන වන විටද නිරවුල් කර නොතිබුණු අතර ඒ සම්බන්ධව ගිණුම් ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී ගෙවීම් කිරීමට කටයුතු කරන බව දක්වමි. | උපචිත වියදම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු අතර, හිඟ විගණන ගාස්තු නිරවුල් කළ යුතුය. |
| (ඇ) | වරින් වර රජය විසින් සිදුකරනු ලැබූ පොහොර මිල අඩු කිරීම හා නොමිලේ ලබාදීම නිසා ගොවිජන සේවා කාරක සභා 07 කට සිදු වූ පාඩුව රු.2,131,162 ක් පොහොර සමාගම්වලින් අයවිය යුතු මුදලක් ලෙස දක්වා තිබීමෙන් එම ප්‍රමාණයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ව්‍යාජ වත්කම් ඇති වී තිබුණි. | අලාභයන් අයකර ගැනීමට ලිපි ඉදිරිපත් කල ද ඒවා නොලැබුණ බැවින් විධිමත් අවසරයක් ලබාගෙන ගිණුම්වලින් ඉවත් කිරීම. | අලාභයන් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | කාරක සභා 03 ක 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ස්ථාවර තැන්පත් වටිනාකම රු.5,387,696 ක් අඩුවෙන් දක්වා තිබීමෙන් ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | ස්ථාවර තැන්පතුවල වර්ෂ අවසාන ශේෂ සනාථන ලබාගෙන නිවැරදි වටිනාකම ගිණුම්ගත කල යුතුය. |
| (ඉ) | ගලහිටියාව ගොවිජන සේවා කාරක සභාවේ වසර 03 සිට 13 දක්වා කාලයක සිට ගෙවිය යුතු ගිණුම් ශේෂ 11 ක එකතුව රු.315,344 ක් නිරීක්ෂණය වුවද එම ශේෂ සම්බන්ධයෙන් ලිඛිත සාක්ෂි නොමැතිවීම සහ වර්ෂ ගණනාවක් ගත වී ඇතත් අදාළ පාර්ශවයන් ගෙවීම් ලබාගැනීමට ඉදිරිපත් වී නොමැති වුවද එම ශේෂයන් සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් ලබාගෙන ආදායමට ගැනීමට හෝ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | ශේෂ සනාථ කිරීම් කැඳවා විධිමත් අනුමැතියක් යටතේ කටයුතු කර නිරවුල් කිරීම් කළ යුතුය. |
| (ඊ) | ගලහිටියාව ගොවිජන සේවා කාරක සභාවේ පසුගිය වර්ෂයේ ගිණුම් ප්‍රකාශනවල ද දක්වා තිබූ රු.132,458 ක් වූ කපාහැරීමට නිර්දේශිත තොග සමාලෝචිත වර්ෂය අවසානයේ දී ද කපා හැර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | විධිමත් අනුමැතියක් ලබාගෙන කපාහැරීමට කටයුතු කල යුතුය. |

### 1.3.3 නොසැසඳුනු ණය පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගලහිටියාව ගොවිජන සේවා කාරක සභා මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව දක්වා තිබූ සහනාධාර පොහොර (එම්ඕපී) මුදල් ලැබීම රු.3,049,671 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශනවල එකී වටිනාකම රු.2,439,651 ක් ලෙස දැක්වීමෙන් රු.610,020 ක වෙනසක් පැවතුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | ගිණුම් ශේෂ සසඳා නිවැරදි ශේෂය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කළ යුතුය. |
| (ආ) | ගලහිටියාව ගොවිජන සේවා කාරක සභාවේ ශේෂ පිරික්සුමෙහි 2023 ජනවාරි 01 දිනට ආරම්භක හර හා බැර ශේෂ අතර රු.500,943 ක වෙනසක් පැවතුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | - එම - |

### 1.3.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විධායක ලේකම්ගේ අනුමැතියකින් තොරව ගොවිජන සේවා කාරක සභා 04 ක ගෙවීම් වවුචර් 60 ක් මගින් රු.1,496,300 ක ගෙවීම් සිදු කර තිබුණි. | පිළිගනිමි. ඉදිරියේදී එවැනි තත්ත්වයන් ඇති නොවන සේ කටයුතු කරමි. | විධායක ලේකම්ගේ අනුමැතිය ලබාගෙන ගෙවීම් සිදු කළ යුතුය. |
| (ආ) | රු.100,000 ට වඩා වැඩි ගෙවීම් සම්බන්ධයෙන් ගොවිජන සේවා සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගත යුතු වුව ද සමාලෝචිත වර්ෂය තුලදී අනුමැතියකින් තොරව ගොවිජන සේවා කාරක සභා 06 ක ගෙවීම් වවුචර් 16 ක් මගින් එකතුව රු.4,283,419 ක් වූ ගෙවීම් සිදු කර තිබුණි. | පිළිගනිමි. ඉදිරියේ දී එවැනි තත්ත්වයක් ඇති නොවන සේ කටයුතු කරමි. | ගොවිජන සේවා සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන ගෙවීම් සිදු කළ යුතුය. |

### 1.3.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 03 ක එකතු වටිනාකම රු.120,626 ක ජංගම වත්කම්වලට අදාලව සහ එකතු වටිනාකම රු.234,681 ක ජංගම වගකීම්වලට අදාලව ලිපි ගොනු , ඉතිරි | පිළිගනිමි. | ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිරීමේ පාස් පොත්, ශේෂ සනාථ කිරීමේ ලිපි, කුලී ගිවිසුම් වැනි ලිඛිත සාක්ෂි නොතිබීම හේතුවෙන් එම ගිණුම් ශේෂයන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | | |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 04 ක එකතු වටිනාකම රු.1,897,242 ක් වූ ස්ථාවර තැන්පත්වලට අදාලව ස්ථාවර තැන්පත් ලේඛන, කල් පිරීමේ නිවේදන වැනි ලිඛිත සාක්ෂි නොතිබීම හේතුවෙන් එම ගිණුම් ශේෂයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේ ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරමි. | ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය |
| (ඇ) | ගලහිටියාව ගොවිජන සේවා කාරක සභාවේ ගනුදෙනු සම්පූර්ණව හා විධිමත්ව සටහන් කරන ලද පොදු ලෙජරයක් හෝ පොදු ජ'නලයක් කාරක සභාව සතු නොවූ අතර අසම්පූර්ණ පොදු ලෙජරයක් විගණනයට ඉදිරිපත් කෙරුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | සම්පූර්ණව හා විධිමත්ව ගණුදෙණු සටහන් කරන ලද පොදු ලෙජරය හා පොදු ජ'නලයක් පිළියෙල කල යුතුය. |
| (ඈ) | ගලහිටියාව ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ විගණන කටයුතු සඳහා සහනාධාර පොහොර ලැබීම හා බෙදාදීමට අදාල තොග ලේඛන දෛනික ලැබීම් ලේඛන, මුදල් ලැබීම් කුවිතාන්සි දෛනික අලෙවි ලේඛන, බැංකු ප්‍රකාශන, බැංකු සැසඳුම් වාර්තාව, සහනාධාර පොහොර ඉන්වොයිසි ලිපිගොනු, බැංකු තැන්පතු කුවිතාන්සි විගණනය වෙත ඉදිරිපත් නොවූයෙන් මූල්‍ය ප්‍රකාශන තුල සඳහන් සමාලෝචිත වර්ෂය තුල දී කරන ලද සහනාධාර පොහොර සඳහා සම්බන්ධ රු.11,351,779 ක හර ගනුදෙනු සහ රු. 1,272,416 ක බැර ගනුදෙනු හා සහනාධාර පොහොර එම්ඕපී රු.2,439,651 ක් සම්බන්ධයෙන් විගණනයට තහවුරුවක් නොවීය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සමග අදාල ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය |

## 1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත | | | |
| (i) 15 | බඩල්ගම හා පල්ලෙවෙල ගොවිජන සේවා කාරක සභාවල ඉඩම් හිමියන් වෙත ගෙවිය යුතු රු.346,697 ක් වූ ප්‍රවේනි මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |
| (ii) 52(i) | සෑම කන්නයකටම පෙරාතුව ගොවිජන සේවා කාරක සභා සඳහා කෘෂිකාර්මික වැඩසටහන් පිළියෙල කළ යුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 04 ක් එලෙස කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 110 | කාරක සභා 07 කට අදාලව හානි හා පාඩු සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි. | හානි හා පාඩු පිළිබඳ ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 133,134 | ගොවිජන සේවා කාරක සභා 19 කට අදාල එම කාරක සභාවල අභ්‍යන්තර විගණන සිදුකර එම වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගනිමි. | - එම - |
| (iii) මුදල් රෙගුලාසි 185 | ගලහිටියාව ගොවිජන සේවා කාරක සභාවල මුදල් භාර ගැනීමේ නිලධාරියෙකු ලැබෙන සියලුම මුදල්, මුදල් පොතේ හා ඒ සඳහා නියමිත වෙනත් පොත් වලද නිසි පරිදි | පිළිතුරු ලබා දී නොතිබුණි. | - එම - |

| | | | |
|---|---|---|---|
| | සටහන් කල යුතු වුවද කාරක සභාවේ ලැබීම් සටහන්වලට අදාල බැර සටහන් තබා නොතිබුණි. | | |
| (iv) මුදල් රෙගුලාසි 395 | ගලහිටියාව ගොවිජන සේවා කාරක සභාවේ ජංගම ගිණුම් දෙකක් සඳහා 2023 ජූලි සිට දෙසැම්බර් මාසය දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (v) මුදල් රෙගුලාසි 880,891(1) | ගොවිජන සේවා කාරක සභා 15 කට අදාල ඇප තැබිය යුතු නිලධාරින්ගේ හා සේවකයන්ගේ තොරතුරු ඇතුලත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | එකඟ වෙමි. | - එම - |
| (ඇ) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ | | | |
| (i) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2020 ජූනි 25 දිනැති අංක 8/2020 දරන චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභා 26 හිම ගොවිජන සංවර්ධන නිලධාරී, මධ්‍යස්ථාන ලිපිකරු සහ කෘ.ප.නි.ස.(බැංකු) නිලධාරින්ගෙන් පිළිවෙලින් රු.15,000, රු.5000 සහ රු.2,500 බැගින් ඇප තැන්පතු ලබාගෙන නොතිබුණි. | ඇප තැබීම සඳහා සහකාර කොමසාරිස් - ගම්පහ වෙත ලිඛිතව එකඟතාවය යොමුකර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii)2016 පෙබරවාරි 09 දිනැති අංක 03/2016 දරන චක්‍රලේඛය | බල ප්‍රදේශය තුල ලියාපදිංචි ගොවි සංවිධානවල ක්‍රියාකාරීත්වය පිළිබඳව වර්ෂයකට අවම වශයෙන් 4 වරක් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිළධාරීන් විසින් ද වර්ෂයකට අවම වශයෙන් එක් වරක් විධායක නිළධාරීන් විසින් ද ඉදිරිපත් කර ඇති පර්යේෂණ ආකෘතිය පදනම් කරගෙන පරීක්ෂණ පැවැත්විය යුතු වුවත් කාරක සභා 19 ක බල ප්‍රදේශවල තිබූ ගොවි සංවිධාන 582 ක ක්‍රියාකාරීත්වය පිළිබඳව කිසිඳු පරීක්ෂණයක් ඉදිරිපත් කර තිබූ ආකෘතිය පදනම් කරගෙන සිදුකර නොතිබුණි. | පිළිගනිමි. 2024 ජනවාරි මස සිට ආකෘති මඟින් පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කරමි. | - එම - |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2023 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 21ක එකතුව රු.13,541,017ක අතිරික්තයක් හා කාරක සභා 05ක එකතුව රු.2,826,714ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය හා ඌනතාවය පිළිවෙලින් රු.11,487,637ක් හා රු.487,984ක් විය. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල අනුව ගොවිජන බැංකු 26හි එකතුව රු.7,100,272ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.7,148,416 ක් විය .

### 2.2 මූල්‍ය ප්‍රතිඵල විශ්ලේෂණය

(අ) කාරක සභා 09 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලවල එකතු වටිනාකම රු.7,851,885 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව එම කාරක සභා 09 හි ඉකුත් වර්ෂයේ අතිරික්ත වල එකතු වටිනාකම රු.3,589,344 ක් විය. ඒ අනුව එම කාරක සභා 09 හි මූල්‍ය ප්‍රතිඵලයන් හි රු.4,262,541 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයන්ට අක්කර බදු ආදායම් වැඩි වීම, ස්ථාවර තැන්පත් පොලී ආදායම් වැඩිවීම, අලෙවිහල් ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ආ) එමෙන්ම කාරක සභා 04 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයෙහි එකතු වටිනාකම රු.2,917,916 ක අතිරික්තයක් වුවත්, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ එම කාරක සභා 04 හි ඌනතාවල එකතු වටිනාකම රු.487,984 ක් විය. ඒ අනුව එම කාරක සභා 04 හි මූල්‍ය ප්‍රතිඵලන්හි රු.3,405,900 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයන්ට අක්කර බදු ආදායම් වැඩිවීම, පොහොර ආදායම් වැඩිවීම, අලුත්වැඩියා වියදම් අඩුවීම, ගාස්තු ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ඇ) කාරක සභා 05 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලවල එකතු වටිනාකම රු.2,826,714 ක ඌනතාවයක් පෙන්නුම් කළ අතර, ඊට ප්‍රතිරූපීව එම කාරක සභා 05 හි ඉකුත් වර්ෂයේ අතිරික්තවල එකතු වටිනාකම රු.2,295,130 ක් විය. ඒ අනුව එම කාරක සභා 05 හි මූල්‍ය ප්‍රතිඵලයන්හි රු.5,121,844ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අලෙවි ආදායම් අඩුවීම, ආරක්ෂිත වැටවල් ඉදිකිරීම් වියදම් වැඩිවීම, ලිපිද්‍රව්‍ය වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ඈ) කාරක සභා 08 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵල එකතු වටිනාකම රු.2,771,216 ක අතිරික්තයක් පෙන්නුම් කළ අතර, ඊට අනුරූපීව එම කාරක සභා 08 හි ඉකුත් වර්ෂයේ ලාභවල එකතු වටිනාකම රු.5,603,163ක් විය. ඒ අනුව එම කාරක සභා 08 හි මූල්‍ය ප්‍රතිඵලයන්හි රු.2,831,947 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අලෙවි ආදායම් අඩුවීමත්, පරිගණක මෘදුකාංග මිලදී ගැනීම ඇතුළු වියදම් වැඩිවීමත් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණය අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 26 පිහිටා ඇති අක්කර 23 කට ආසන්න භූමිය අදාල ආයතන වෙතින් කාරක සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වෙමි. දෙපාර්තමේන්තු උපදෙස් මත ඉදිරි කටයුතු සිදු කරමි. | ඉඩම් පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ආ) | කාරක සභා බල ප්‍රදේශ 26 ට අයත් මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 58,573 ක් වන අතර ඉන් වී වගා කළ හැකි කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 36,557 ක් විය. 2023/24 මහ කන්නයේ වී වගාකල ඉඩම් ප්‍රමාණය අක්කර 24,815 ක් විය. මේ අනුව මහ කන්නයේ වගා නොකළ කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 11,742 ක් වී තිබුණි. | පිළිගනිමි. ඉදිරියේදී පුරන් කුඹුරු ප්‍රමාණය අවම කිරීමට උත්සාහ දරන බව දන්වා සිටිමි. | වගා නොකළ කුඹුරු ඉඩම් වගා කිරීම කෙරෙහි අවධානය යොමු විය යුතුය. |
| (ඇ) | වර්ෂ ගණනාවක සිට පැවත එන ගොවිජන සේවා කාරක සභා 7 ක ලැබිය යුතු ශේෂ එකතුව රු. 2,601,559 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දී කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | පිළිගනිමි. | ශේෂ අයකර ගැනීමට ක්‍රියා කල යුතුය. |
| (ඈ) | ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්ගේ 2013 මාර්තු 08 දිනැති අංක 04/2013 දරන චක්‍රලේඛයේ ගොවිජන සේවා කාරක සභාවල ආදායම් තත්ත්වය වර්ධනය කරගැනීම සම්බන්ධයෙන් උපදෙස් ලබාදී තිබුණ ද, කාරක සභා 06 ක් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කර නොතිබුණි. | පිළිගනිමි. | කාරක සභාවල ආදායම් තත්ත්වය වර්ධනය කරගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු කල යුතුය. |
| (ඉ) | 2009 අප්‍රේල් මස 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේකයේ 4 වන වගන්තිය ප්‍රකාරව ඇගිලි සලකුණු යන්ත්‍ර මිල දී ගැනීමට පෙර එහි නිවැරදි ක්‍රියාකාරීත්වය, කල් පැවැත්ම, අමතර කොටස් මිලදී ගැනීමේ හැකියාව හා අඩු වියදමකින් නඩත්තු කළ හැකිවීම යනාදිය පිළිබඳ සැලකිලිමත් නොවීම හේතුවෙන් ගොවිජන සේවා කාරක සභාවල සවිකර ඇති ඇගිලි සලකුණු යන්ත්‍ර නිරන්තරයෙන් අක්‍රිය තත්වයට පත් වී තිබුණි. ගොවිජන සේවා කාරක සභා 10 ක් විසින් වාර්ෂිකව සේවා ගාස්තු වශයෙන් රු.97,000 ක් ගෙවීම් කර තිබුණ ද 2024 අගෝස්තු වන විට යන්ත්‍රයේ ඇගිලි සටහන් සලකුණු | පිළිගනිමි. ඇඟිලි සළකුණු යන්ත්‍රයේ පවතින අඩුපාඩු පිළිබඳව අදාළ සමාගම හා දිස්ත්‍රික් කාර්යාලය දැනුවත් කර ඇත. | ඇගිලි සලකුණු යන්ත්‍ර ක්‍රියාකාරීව පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කරන නමුත් එහි පවතින මෘදුකාංග දෝෂයක් හේතුවෙන් වාර්තා ලබාගත නොහැකි තත්වයක් පැවතීම මත ඇඟිලි සලකුණු යන්ත්‍ර සවිකිරීමේ අරමුණු ඉටු වී නොතිබුණි. | | |
| (ඊ) | විකුණා මුදල් ගෙවීමේ පදනම මත කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර නිලධාරීන් වෙත ද්‍රව්‍ය නිකුත් කිරීමේ දී එක් එක් නිලධාරියා වෙත ලබාදෙන ලද උපරිම ද්‍රව්‍ය වටිනාකම හා මුදල් පියවිය යුතු කාලසීමාව නිශ්චිතව තීරණය කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ගොවිජන කාරක සභා 4 ක එකතුව රු.458,341 ක මුදලක් දීර්ඝ කාලයක සිට අයනොවී පැවතුණි. | පිළිගනිමි. | මුදල් ආපසු අය කර ගැනීමට සුදුසු පියවර ගත යුතුය. |
| (උ) | 2011 පෙබරවාරි 01 දිනැති ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2011 ප්‍රකාරව පාවිච්චි කරන ලද උපපත්‍රිකා පොත් ආපසු භාරදිය යුතු අතර උපපත්‍රිකා පොත් නැවත නිකුත් කිරීම සිදුකළ යුත්තේ මුලින් භාරදුන් පොත් ආපසු භාරගැනීම මෙන් පසුව වුව ද ගොවිජන සේවා කාරක සභා 05 ක් මඟින් එක් කුවිතාන්සි පොතක් නැවත භාරදීමෙන් තොරව තවත් එක් කුවිතාන්සි පොතක් අදාළ නිලධාරීන් වෙත භාරදී තිබුණි. | පිළිගනිමි. උපපත්‍රිකා පොත් ආපසු භාරදෙන මෙන් අදාළ නිලධාරීන් දැනුවත් කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඌ) | ගොවිජන සේවා කාරක සභා බලප්‍රදේශ 26 තුළ සමාලෝචිත වර්ෂයේ දී ගොවි සංවිධාන 943 ක් පැවති අතර ඉන් ගොවි සංවිධාන 119 ක් අක්‍රීය මට්ටමේ පැවතුණි. කාන්තා ගොවි සංවිධාන 1338 ක් පැවති අතර ඉන් 345 ක්ම අක්‍රිය මට්ටමේ පැවතුණි. මෙම ගොවි සංවිධාන සක්‍රීය කිරීමට සමාලෝචිත වර්ෂයේදී පියවර ගෙන නොතිබුණි. | පිළිගනිමි. | අක්‍රීය ගොවි සංවිධාන සක්‍රීය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කාරක සභා 02 ක් වෙත ලැබී තිබුණු ගොවි පැමිණිලි 63 ක් අතරින් 13 ක් නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | පිළිගනිමි. නිරවුල් කිරීමට පියවර ගනිමි. | ගොවි පැමිණිලි හැකි ඉක්මණින් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඒ) | ජා ඇල ගොවිජන සේවා කාරක සභාව තුල අඩක් නිමකල අලෙවි සැලක් පැවති අතර ගොඩනැගිල්ලෙහි කටයුතු නිම කර උපයෝජනය කිරීමට සමාලෝචිත වර්ෂයේදීද පියවරක් ගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | අලෙවිසැල කඩිනමින් ඉදිකර අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | ගොවිජන කාරක සභා 03 ක් සතු ට්‍රැක්ටර් රථ 04ක් පිළිවෙලින් මාසික කුලිය රු.150, රු.200 රු.1,500 හා කන්නයකට රු.750 බැගින් ඉතාම අඩු මුදලකට ගොවි සංවිධාන වෙත කුලියට ලබාදී තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා අය වී තිබූ ආදායම රු.27,700 ක් පමණක් විය. | කාරක සභා තීරණ මත පැරණි ගිවිසුම් අවලංගු කර සංශෝධනය කිරීමට කටයුතු කරමි. | ගාස්තු සංශෝධනය කර ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඕ) | පමුණුගම ගොවිජන සේවා කාරක සභාවේ කෘෂිකාර්මික ඉඩම් නොවන බවට සහතික නිකුත් කිරීමෙන් ලද මුදලින් රු.2,319,114ක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණද පසුගිය වර්ෂයට අදාලව ගෙවිය යුතු රු.231,752ක් ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | අදාළ මුදල් ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ක) | බෙම්මුල්ල ගොවිජන සේවා කාරක සභාවේ 2021/22 මහ කන්නය සඳහා ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය විසින් කාරක සභාවට ලබාදී තිබුණු 2022 වර්ෂයේ ජූලි 01 දින කල් ඉකුත් වූ කාබනික දියර පොහොර ලීටර් 913 ක් අපහරණය කිරීමට අවශ්‍ය පියවර සමාලෝචිත වර්ෂය අවසානයටත් ගෙන නොතිබුණි. | කල් ඉකුත් වූ පොහොර තොගය අපහරණය කිරීම අනුමැතිය ඉල්ලා ඇත. | කල් ඉකුත් වූ පොහොර අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණ | කළමණාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 13 කට අදාලව 2021/22 මහකන්නයේ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක් ලබා දී තිබුණු එකතුව රු.1,300,000 ක් වූ ප්‍රතිපාදනවලින් රු.638,099 ක මුදලක් අදාල කාර්යයට යොදාගෙන නොතිබුණි. | එකඟ වෙමි. උපදෙස් ලැබීමෙන් අනතුරුව මුදල් ආපසු යැවීමට කටයුතු කරමි. | අදාළ කොම්පෝස්ට් නිෂ්පාදන කටයුතු සඳහා යොදාගැනීමට හෝ ගොවිජන සංවර්ධන කොමසාරිස් වෙත නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | මාබොදල, බඩල්ගම හා ආඬිඅම්බලම ගොවිජන සේවා කාරක සභාවල ජංගම ගිණුම්වල පවතින පිළිවෙලින් රු.2,432,937ක්, රු.3,196,931ක්, රු.2,401,140 ක්වූ වර්ෂ අවසාන ජංගම ගිණුම් ශේෂ වැඩි පොළියක් ලබාදෙන ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමටට අවධානය යොමුකර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | ජංගම ගිණුමක පවතින අතිරික්ත මුදල් විධිමත් අනුමැතිය යටතේ ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණ | කළමණාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මීනුවන්ගොඩ ගොවිජන සේවා කාරක සභාවේ , පමුණුගම ගොවිජන සේවා කාරක සභාවේ හා මරදගහමුල ගොවිජන සේවා කාරක සභාවේ අලෙවි කුටි ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යය පැවතුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | ඵලදායී කාර්යයන්ට යොදාගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | මරදගහමුල ගොවිජන සේවා කාරක සභාවේ අත්ට්‍රැක්ටරය හා බියගම ගොවිජන සේවා කාරක සභාවේ ගොයම් කපන යන්ත්‍රයක් වසර ගණනාවක සිට නිශ්ක්‍රීයව පැවතුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | ඵලදායී කාර්යයකට යොදාගැනීම හෝ යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාරක සභා 26 කට අදාලව කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර වසම් 739 ක් පැවති අතර, අදාල වසම් සඳහා අනුයුක්ත කළ නිලධාරීන්ගේ සංඛ්‍යාව 528 ක් වීම හේතුවෙන් වසම් 211 ක වැඩ බලන තත්ත්වයක් ඇති වී තිබුණි. | පුරප්පාඩු වන කෘ.ප.නි.ස වසම් සඳහා නව නිලධාරින් බඳවා නොගැනීම හේතුවෙන් එම වසම් සඳහා වැඩ බලන නිලධාරීන් පත්කර ඇත. | වසම්වල ජීවත්වන ගොවිජනතාවගේ සේවය නිසි පරිදි ඉටුකර දීමට ක්‍රියා කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණ | කළමණාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර මුදල් වර්ෂය අවසන් වී මාස 03 ක් ගතවීමට පෙරාතුව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද ගලහිටියාව ගොවිජන සේවා කාරක සභාව විසින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ දින 90 ක් ප්‍රමාද වීමෙන් පසුව එනම් 2024 ජූලි 01 දින විය. | අදහස් දක්වා නොතිබුණි. | ගිණුම් ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කළ යුතුය. |

## 5. ගොවිජන බැංකු

| විගණන නිරීක්ෂණය | | කළමණාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 23 කට අයත් ගොවිජන බැංකු 23කට අදාලව කල් ඉකුත් වූ ණය අය කර ගැනීම සඳහා විනිශ්චය සභා වෙත යොමු කිරීම, අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම සිදු කර තිබුණද 2023 දෙසැම්බර් 31 දිනට බැංකු විසින් ලබාදුන් ණය වලින් කල් ඉකුත් වූ එකතුව රු. 20,129,703 ක් වූ ණය මුදලක් අය නොවී පැවතුණි. | අයකරගැනීමට පියවර ගනිමි. | හිඟ ණය මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුයි. |
| (ආ) | ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ 2022 අප්‍රේල් 27 දිනැති අංක 7/12/5/4 දරන චක්‍රලේඛ ලිපියේ 04 ඡේදය ප්‍රකාරව ලියාපදිංචි ගොවි සංවිධානවල පවතින අරමුදල්වලින් කොටසක් ගොවිජන බැංකුවෙහි තැන්පත් කලයුතු වුවත් කාරක සභා 06 කට අදාළව මුළු ගොවි සංවිධාන සංඛ්‍යාව වූ 213 ක් අතරින් ගොවිජන බැංකු 06 හි තැන්පත් පවත්වාගෙන ගොස් ඇත්තේ ගොවි සංවිධාන 71 ක් පමණි. ගොවිජන සේවා කාරක සභාවල ගොවි සංවිධාන තැන්පත් වර්ධනය කර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී තැන්පත් වර්ධනය කර ගැනීමට පියවර ගනිමි. | ගොවිජන සේවා කාරක සභාවල ගොවි සංවිධාන තැන්පත් වර්ධනය කරගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | බෙම්මුල්ල ගොවිජන බැංකුවේ කොටස් හිමි සාමාජික ලෙජරය සහ තැන්පත් ලෙජරය වර්ෂ ගණනාවක සිට යාවත්කාලීන කර නොතිබූ අතර කොටස් හිමියන්ගෙන් ඇතැම් අය මියගොස් තිබුණ ද ඔවුන් කවුරුන් ද යන්න හඳුනාගෙන හෝ උරුමකරුවන්ට පැවරීමට හෝ කටයුතු කර නොතිබුණි. එසේම තැන්පත් ලෙජරය යාවත්කාලීන කර නොතිබුණි. | දැනට මෙම ලෙජර යාවත්කාලීන කිරීමට පියවර ගනිමින් පවතී. | ගොවිජන බැංකුවේ කොටස් හිමි සාමාජික ලෙජරය හා තැන්පත් ලෙජරය නොපමාව යාවත්කාලීන කිරීමට පියවර ගත යුතුයි. |
| (ඈ) | වල්පිට ගොවිජන සේවා කාරක සභාවේ ගොවිජන බැංකුවේ තැන්පත් වර්ග 06 ක් අතරින් කොටස් දායකත්ව ගිණුම් 500 ක්, සාමාන්‍ය ඉතුරුම් ගිණුම් 500 ක් සහ ළමා ඉතුරුම් ගිණුම් 50ක් වශයෙන් ගිණුම් 1 050 ක් අක්‍රීය ගිණුම් ලෙස පැවතිණි. | සමහර ගිණුම් සක්‍රීය කිරීම සඳහා මුදල් ලැබෙමින් පවතී. | ගිණුම් සක්‍රීය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |